පොල්පිතිගම ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 07 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය සමඟ හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුමේ ශේෂය සමාන වියයුතු වූවත්, මෙම ගිණුම් දෙක අතර රු.77,892,792 ක වෙනසක් පැවතුණි.

(ආ) 2015 වර්ෂය තුළ ඉදිකිරීම් නිම කළ රු.5,902,898 ක් වටිනාකමැති ජල පිරිපහදු ඒකක 02 හි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණු අතර සාලියගම සතිපොලේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම්

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 41,146,177 ක් වූ අතර එයින් රු.23,856,176 ක් වටිනා කර්මාන්ත ණයගැති ශේෂයන්ට අදාල කාල විශ්ලේෂණයන් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ii) ආදායම් ණයගැතියන්ගෙන් රු.30,000 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන්ගෙන් සමන්විතව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 33,683,156 ක් වූ අතර එයින් රු.27,654,320 ක් වටිනා කර්මාන්ත හා පොදු සැපයුම් ණයහිමි ශේෂ සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි.

(ii) ආපසු ගෙවිය යුතු තැන්පතුවලින් රු.945,981 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.13,705,836 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.387,497 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,318,339 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.26,602,846 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.31,903,811 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.8,404,871 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් සමඟ පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | 2014 | විචලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 17,961 | 8,433 | 9,528 | පෞද්ගලික පඩිනඩි | 37,164 | 28,787 | 8,377 |
| (ii) | වෙනත් | 41,551 | 32,665 | 8,886 | අනෙකුත් | 8,643 | 11,924 | (3,281) |
| | උප එකතුව | 59,512 | 41,098 | 18,414 | උප එකතුව | 45,807 | 40,711 | 5,096 |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 26,603 | 117,517 | (90,914) | ප්‍රාග්ධන වියදම | 31,903 | 102,234 | (70,331) |
| | මුළු එකතුව | 86,115 | 158,615 | (72,500) | මුළු එකතුව | 77,710 | 142,945 | (65,235) |
| | මෙහෙයුම් ප්‍රතිඵලය | 13,705 | 387 | 13,318 | මූල්‍ය ප්‍රතිඵලය | 8,404 | 15,670 | (7,266) |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම රු.59,512,457 වූ අතර ඉන් සියයට 69.8 ක් හෙවත් රු.41,551,366 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.26,602,846 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම රු.45,806,621 න් සියයට 81 ක් හෙවත් රු.37,163,677 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර ඉන් සියයට 86 ක් හෙවත් රු.32,074,958 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලබා දී තිබුණු අතර එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.31,903,811 න් සියයට 3.2 හෙවත් රු.1,036,727 ක් පමණක් සභා අරමුදලින් වැය කර තිබු අතර ඉතිරි සියයට 96.8 ක් වූ රු.30,867,084 ක ප්‍රමාණය

ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන වලින් ඉටුකළ සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

## 2.3 <u>ආදායම් පරිපාලනය</u>

### 2.3.1 <u>ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය</u>

සමාලෝචිත වර්ෂ හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| | | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 644 | 966 | - | 211 | 386 | - |
| (ii) | බදුකුලී | 5,667 | 5,394 | 24 | 3,980 | 3,882 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,396 | 1,875 | - | 1,265 | 1,571 | - |
| (iv) | වෙනත් ආදායම් | 44,937 | 51,277 | 16,644 | 38,118 | 35,258 | 8,193 |
| | එකතුව | 52,644 | 59,512 | 16,668 | 43,574 | 41,097 | 8,193 |

### 2.3.2 <u>බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්</u>

වර්ෂයේ බිල්කළ ආදායම හා ඒ මත හිඟහිටි ආදායම් පහත සඳහන් පරිදි විය.

| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම | එකතුව | ආදායම් රැස් කිරීම: 2015/01/01 දක්වා හිඟයෙන් | ආදායම් රැස් කිරීම: බිල්කළ ආදායමින් | ආදායම් රැස් කිරීම: එකතුව | හිඟහිටි ශේෂය: 2015/01/01 දිනට පැවති හිඟයෙන් | හිඟහිටි ශේෂය: බිල්කළ ආදායමින් | හිඟහිටි ශේෂය: 2015/12/31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු.000 |
| වරිපනම් හා බදු | - | 966 | 966 | - | 966 | 966 | - | - | - |
| බදු කුලී | - | 5,418 | 5,418 | - | 5,394 | 5,394 | - | 24 | 24 |
| බලපත්‍ර ගාස්තු | - | 1,875 | 1,875 | - | 1,875 | 1,875 | - | - | - |
| වෙනත් ආදායම් | 8,193 | 59,728 | 67,921 | 8,191 | 43,086 | 51,277 | 2 | 16,642 | 16,644 |
| එකතුව | 8,193 | 67,987 | 76,180 | 8,191 | 51,321 | 59,512 | 2 | 16,666 | 16,668 |

බදු කුලී යටතේ සමාලෝචිත වර්ෂයට අදාළ රු 5,667,302 ක ආදායමක් බිල්කර පැවතියද, එයින් අයකර පැවතියේ රු 5,394,567 හෙවත් සියයට 95.18 පමණි.

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ මුදල් ප්‍රමාණය රු.7,652,500 ක් සහ මුද්දර ගාස්තු රු.8,260,300 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.2,037,928 ක් වර්ෂ 02 කට වැඩි කාලයක සිට එකතුවෙමින් පවතින ගෙවිය යුතු ශේෂයන් වන අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2009 වසරේ සිට 2014 වසර දක්වා වසර 01 ත් වසර 06 ත් අතර කාලයක සිට පවතින රු.1,018,911 ක් වූ තැන්පතු ශේෂ 16 ක් 2016 ජනවාරි 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) වාහන ධාවනය වූ විස්තර ඇතුළත් ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොවුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දින වන විට අක්‍රීය ගිණුමක් ලෙස පැවති තිරසාර නඩත්තු ගිණුමෙහි රු.1,585,098 ක බැර ශේෂයක් තිබුණි.

(ආ) සභා කාර්යාලය සඳහා රු.482,000 ක් වැයකර මේස 10 ක්ද, කාර්යාල පුටු 10 ක්ද, ෆයිබර් අල්මාරි 10 ක් හා තට්ටු අල්මාරි 2 ක් මිලදී ගැනීම සම්බන්ධ ලිපිගොණුවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම මිලදී ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් මගින් හෝ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමක් නොකර සෘජුවම ස.ණ.ස සමිති සංගමය මගින් මිලදී ගෙන තිබුණි.

### 3.3 කිරි ගවයින් මිළදී ගැනීම හා බෙදා හැරීම

අයවැය යෝජනා - 2013 පළාත්වල දිළිඳුකම අවම කිරීමේ සංවර්ධන වැඩ සටහන යටතේ ලද රු.1,440,000 ක පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන සහ රු.360,000 ක ප්‍රතිලාභී දායකත්වයක් මත කිරිගවයින් 18 ක් මිලදීගෙන ලබාදී තිබූ අතර පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලිපියේ ඇමුණුම් අංක 02 හි 01 වගන්තිය ප්‍රකාරව කිරිගවයෙකු සඳහා සියයට 20 ක

ප්‍රතිලාභී දායකත්වයක් ලබාගත යුතු බව දක්වා තිබුණි. එහෙත් සභාව විසින් මිලදී ගත් කිරිගවයෙකුගේ වටිනාකම රු.90,000 ත් රු.120,000 ත් අතර පරාසයක වුවද සෑම ප්‍රතිලාභියෙකුගෙන්ම රු.20,000 බැගින් අයකර තිබූ බව අනාවරණය විය. කිරිගවයින් පෞද්ගලික හිමිකරුවන් කිහිපදෙනෙකුගෙන් මිලදී ගැනීම සිදුකර තිබූ අතර අදාල සැපයුම්කරුවන් තෝරාගනු ලැබුවේ කුමන පදනමකින්ද යන තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. කිරිගවයින් ලබාදුන් ප්‍රතිලාභීන් හා සභාව අතර ගිවිසුම් අත්සන් කර තිබුණද එම ගිවිසුමෙහි අදාල ප්‍රතිලාභියාට ලබාදුන් කිරිගවයා හඳුනා ගැනීම පිළිබඳ වූ කිසිදු තොරතුරක් දක්වා නොතිබුණි.

### 3.4 <u>මතභේදයට තුඩුදෙන ගණුදෙනු</u>

(අ) ඉන්වෙන්ට්‍රි ලේඛනයේ පිටු අංක 43 හි ප්ලාස්ටික් පුටු 119 ක ශේෂයක් පැවතියද 2016 ජනවාරි 29 දින භෞතිකව පරීක්ෂා කිරීමේදී පුටු 35 ක හිඟයක් පැවතුණි.

(ආ) 2015 ජූලි 15 දින කර්මාන්ත ගබඩා ගිණුම් ලෙජරයට ඇතුලත් කර තිබූ රු.103,447 ක් වටිනා කුට්ටිගල් 3387 ක් අස්ථානගතවී ඇති බව අනාවරණය විය.

### 3.5 <u>අවිධිමත් ගණුදෙනු</u>

2014 පළාත් නැගුම රු.6,000,000 ක ප්‍රතිපාදන මත පෙට්ටිකඩ 20 ක් ඉදි කිරීමේ කර්මාන්තය සිදුකර තිබූ අතර 2014 දෙසැම්බර් 17 දින නැවත 8´-6´ පෙට්ටි කඩ සඳහා රු.198,142 ක හා 8´-12´ පෙට්ටි කඩ සඳහා රු.306,016 ක ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. තාක්ෂණික නිලධාරී විසින් 2014 අගෝස්තු 01 හා දෙසැම්බර් 17 යන දින මිල ගණන් දෙකකට ඇස්තමේන්තු සකස් කර තිබුණි. මේ සඳහා පුවත්පත් දැන්වීම් පලකර මිල ගණන් කැඳවීමක් සිදුකර නොතිබුණි. මුල් ඇස්තමේන්තුව පදනම් කරගෙන 2014 සැප්තැම්බර් 24 දිනැතිව පොල්පිතිගම ප්‍රදේශයේ ආයතන 3 කින් මිල ගණන් ලබාගෙන තිබූ අතර පසුව දින රහිතව තවත් ආයතන 3 කින් මිල ගණන් ලබාගෙන මුලින් ලබා ගත් මිල ගණන් පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන දින රහිතව පසුව ලබාගත් මිල ගණන් 3 පමණක් මහ සභාව වෙත ඉදිරිපත් කර තිබුණි. ඉදිරිපත්ව තිබූ මිල ගණන් අනුව 8´-6´ පෙට්ටි කඩයක් සඳහා රු.168,000 ක අවම මිලක් ´ධනාරා වෙල්ඩින් වර්ක්ස්´ වෙතින් ඉදිරිපත් කර තිබුණද එම මිල ගණන් නොසලකා 8´-6´ ප්‍රමාණයේ එක් පෙට්ටි කඩයක් සඳහා රු.198,000 බැගින් කඩ 9 ක් සෑදීම සඳහා අදාල කර්මාන්තය ´කවීෂ අයන් වර්ක්ස්´ වෙත ලබාදී තිබුණි. මේ අනුව එක් පෙට්ටි කඩයක් සඳහා රු.30,000 බැගින් පෙට්ටිකඩ 09 ක් සඳහා රු.270,000 ක් සභාවට වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8-9-3 වගන්ති ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

### 3.6.1 පොල්පිතිගම මහජන ක්‍රීඩාංගනයේ පොදු වැසිකිලිය ඉදිකිරීම

රු.1,980,120 ක ඇස්තමේන්තුවක් මත සභාව විසින් සෘජු ඉදි කිරීමක් වශයෙන් පොල්පිතිගම මහජන ක්‍රීඩාංගනයේ පොදු වැසිකිලිය 2014 පළාත් නැගුම රු.2,000,000 ක ප්‍රතිපාදන මත ඉදිකර තිබුණි. 2015 අප්‍රේල් 30 දින මෙම කර්මාන්තය සඳහා ලබාගත් ද්‍රව්‍ය සඳහා රු.1,200,000 ක් ආයතනයක් ගෙවා තිබුණි. කර්මාන්තය වෙත ලබාගත් ද්‍රව්‍යවලට අදාල ඉන්වොයිස් පත් හෝ ගබඩා ලැබීම් පත් ඉදිරිපත් කර නොතිබුණි. සභාව විසින් සෘජු ඉදි කිරීම් ලෙස මෙම කර්මාන්තය සිදුකර තිබුණද ලිපිගොණුව අනුව කර්මාන්තය සඳහා රු.1,752,398 ක මුදලක් ලබාදී ඇතත් විගණිත දිනය වූ 2016 පෙබරවාරි 05 දින වන විටද ශ්‍රමය සඳහා කිසිදු මුදලක් ගෙවා නොතිබුණි.තවද 2014 නොවැම්බර් 26 දිනැතිව තාක්ෂණ නිලධාරී මගින් රු.1,973,113 ක නිම්වැඩ වාර්තාවක් පිළියෙල කර තිබූ අතර 2015 මැයි 02 දින සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී රු.62,164 ක් වටිනා උපාංග සවිකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 3.6.2 කාර්යාලයේ ඉහල මහලේ ඉතිරි වැඩ නිම කිරීම

රු.4,500,000 ක ඇස්තමේන්තුවක් මත සභා අරමුදල් වැයකර කාර්යාලයේ ඉහල මහලේ ඉතිරි වැඩ නිම කිරීමේදී පුවත්පත් මගින් මිල ගණන් කැඳවා කොන්ත්‍රාත් ක්‍රමයට ලබාදී තිබූ අතර කොන්ත්‍රාත්තුව ලබා දීම සඳහා වූ ක්‍රියාවලිය පිළිබඳ විගණනයේදී ප්‍රශ්ණකාරී වූ අතර එක් එක් කාර්යයන් සිදුකර ඇති දිනයන්හි පරස්පරතා දක්නට ලැබුණි. තවද රැඳවුම් මුදල් වශයෙන් රු.143,813 ක් රඳවාගත යුතු වුවද සභාව විසින් රු.88,813 ක් පමණක් රඳවාගෙන තිබුණි. මෙම කර්මාන්තය මාස 3 කින් නිම කිරීම සඳහා 2015 මැයි 02 දින අදාල කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් අත්සන් කර තිබුණද, විගණිත දිනය වූ 2016 පෙබරවාරි 05 දින වන විට ගිවිසුම් කාලය අවසන් වී මාස 06 ක් පමණ ගතවී ඇතත් අදාල කර්මාන්තය නිමකර නොතිබුණි. ප්‍රමාද වන කාලයට අදාලව ප්‍රමාද ගාස්තු අය කිරීම් සම්බන්ධ විධිවිධාන ගිවිසුමෙහි දක්වා නොතිබූ අතර අදාල කර්මාන්තය ඉටු කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 04 ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

### 4.1 වත්කම් කළමනාකරණය

#### 4.1.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් 2011 අගෝස්තු 22 දින රු.61,600 කට මිලදීගෙන තිබුණු ඇඹිලි සලකුණු යන්ත්‍රය 2014 නොවැම්බර් මාසයේ සිට 2016 පෙබරවාරි මාසය වන විටත් නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2013 වර්ෂයේ රු.280,000 කට මිලට ගෙන තිබුණු කුට්ටිගල් යන්ත්‍ර 02 ක් 2014, 2015 වර්ෂවල නිශ්කාර්යව පැවති අතර එම වර්ෂවල කුට්ටිගල් බාහිර ආයතනවලින් මිලදීගෙන තිබුණි.

(ඇ) සභාව සතු වත්කම් 04 ක් නිශ්කාර්යයව පැවතුණි.

## 05 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පාලනය